පුද්ගලයෙකුගේ [පුද්ගලයන්ගේ] වර්ගය පිළිබඳ විස්තර පුවතට සෘජුවම අදාළ වන්නේ නම් විනා, එසේ නැතිව ප්‍රකාශයට පත් කිරීමෙන් වැළකිය යුත්තේය යනුවෙන් ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් හඳුන්වා දී ඇති වෘත්තිය ප්‍රතිපත්ති මාලාවේ මෙන්ම ජාත්‍යන්තරව පිළිගැනෙනා මාධ්‍ය ආචාර ධර්මයන්හිද සඳහන් වේ.

අරුණ පුවත්පතේ (12/08) "හරක් අරක් ගත් ජල ගැලුම් නිම්නය ගිනි ගනියි" යන සිරස්තලය යටතේ පළවූ ලිපියක් අපගේ අවධානයට යොමු විණි. එහි දැක්වෙන ගැටළු වලට වගකිව යුත්තන් ලෙසින් "ඇතැම් මුස්ලිම් පිරිස්" දක්වා තිබෙන අතර, මෙම වාර්ගිකත්වය ලිපියේ කිහිප තැනකම සඳහන්ව ඇත.

මෙම වාර්ගිකත්වය සඳහන් කිරීම ලිපියට සෘජුවම අදාළ යැයි ඔබ සිතන්නේද? එසේ නොවේ නම්, එය ඉහත ආචාර ධර්මය උල්ලංඝනය කිරීමක් නොවන්නේද?

**#MediaEthicsSL #lka #SinhalaNews #Aruna**